# වලගම්බාහුව ග්‍රාමය ආශ්‍රිතව පවතින සම්ප්‍රදායික මුට්ටි මංගල්‍යය

කේ.කේ.පී.එම්. ජයතිලක[1]

වැව පිළිබඳව ගැමියා තුළ ඇත්තේ ගෞරවාන්විත හැඟීමකි. වැව යනු අද්භූත බලවේග සඟවාගත් උතුම් ක්ෂේත්‍රයක් ලෙස ගැමියන් විශ්වාස කරයි. ලක්දිව පුරා විවිධ ප්‍රදේශවල එම ප්‍රදේශයට හා ජන සමාජයන්ට ආවේණික වූ විශ්වාස ඇදහිලි හා පුද පූජා දැකගත හැකිය. ඒ අනුව ශ්‍රී ලාංකේය වාරි සංස්කෘතියේ සංධිස්ථානයක් ලෙස සලකන උතුරු මැද පළාතේ නුවරකලාවිය ආශ්‍රිතව දැකගත හැකි වැව් හා බැඳී පූජාවක් ලෙස මුට්ටි මංගල්‍යය ප්‍රධාන තැනක් ගනු ලැබේ. මෙම අධ්‍යයනයේ දී අනුරාධපුර වලගම්බාහුව ග්‍රාමය ආශ්‍රිතව සිදු කරනු ලබන මුට්ටි මංගල්‍යය පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ. මෙහි දී මුට්ටි මංගල්‍යය පිළිබඳව ගැමි ජනතාව අතර පවතින විශ්වාසය කෙබඳු ද යන පර්යේෂණ ගැටලුව ප්‍රධාන කරගනිමින් මෙම පූජා මංගල්‍යයෙහි පූජා ක්‍රම, සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍ර හා විශ්වාස පිළිබඳව අධ්‍යයන කිරීම සිදු කරන ලදි. අධ්‍යයන ක්‍රමවේදය ලෙස සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය, ගවේෂණ, නිරීක්ෂණ හා වලගම්බාහුව ග්‍රාමයේ ගැමි ජනයා සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේද භාවිත කරන ලදී. අයියනායක, පුල්ලෙයාර් ඇතුළු දෙවි දේවතාවුන්ගෙන් වැව, ගම, ගම්වැසියන් ආරක්ෂා කරගැනීමට ආශීර්වාද පතා මෙම මංගල්‍යය සිදු කරනු ලැබේ. සිංහල ජන සමාජය තුළ පමණක් නොව ද්‍රවිඩ ජන සමාජය තුළ ද කිරි ඉතිරවීම සෞභාග්‍යයේ සංකේතය ලෙස සලකේ. කිරි උතුරවා ආරක්ෂාව මෙන්ම වැවට කෘතගුණ සැලකීම ඉන් අපේක්ෂා කරනු ලැබේ. හොඳින් වැසි ලැබී වැව් පිරියාමෙන් අනතුරුව ගොවිතැන් සිදුකර අස්වැන්නෙන් ලබාගන්නා ප්‍රථම භාගය දෙවියන් උදෙසා මෙහිදී පූජා කරනු ලැබේ. අනුමැතිරාළ විසින් කෝල්මුර කවි කියා දේව කන්නලව් කර උඩැක්කි ගසමින් දෙවියන් උදෙසා මෙහිදී පූජා සිදුකරනු ලබන අතර යහන් පිළියෙළ කර පේවී කරනු ලබන මෙම මංගල්‍යයේ විශේෂත්වය වනුයේ බවලත් උදවිය හට මෙයට සහභාගී වීමට තහංචි පැනවීමයි. අනුමැතිරාළගේ ප්‍රධානත්වයෙන් වෙල් විදානේගේ හා ගැමියන්ගේ සහභාගිත්වයෙන් මෙහි පූජා විධි සිදුකරනු ලැබේ. මෙම ප්‍රදේශය ආශ්‍රිතව කුල ක්‍රමය තවමත් දැකිය හැකිය. ඔවුන් මෙම පූජා මංගල්‍ය සඳහා හේනේ මාමා වැනි පුද්ගලයින් ද සම්බන්ධ කරගනී. මෙම මුට්ටි මංගල්‍යය ආශ්‍රිත සම්ප්‍රදායික ලක්ෂණ ඇතුලත්ව ඇතත් ඇතැම් සම්ප්‍රදායික ලක්ෂණයන් අභාවයට ගොස් තිබේ. වර්තමානය වන විට බොහෝ වැව් ගම්මාන ආශ්‍රිතව මෙබඳු පූජා ක්‍රම දැකගැනීම අපහසු වන අතර ඒවා පිළිබඳව දැනුමැති පුද්ගලයින් සොයා ගැනීම ද දුෂ්කර වේ. මුට්ටි මංගල්‍යය අනෙකුත් සම්ප්‍රදායික වැව් මංගල්‍ය හා සමානකම් දක්වන අතර ගම් කොටුවටත්, වැවටත් තමන්ටත් යහපතක් සිදුවන බවට ගැමියන් අතර තවමත් විශ්වාසයක් පවතින බව මේ අනුව පෙන්වාදිය හැකිය.

ප්‍රමුඛ පද : නුවරකලාවිය, වැව, සම්ප්‍රදායික ඇදහිලි, මුට්ටි මංගල්‍යය, ගැමි ජන ජීවිතය,

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.madarajayathilake@gmail.com